රොක්බෑන්ක්හි පාරමිතා බෞද්ධ විහාරවාසී,
මහනුවර අස්ගිරි මහාවිහාර මහ පිරිවෙණේ ආචාර්ය,
**ඉඳිපරපේ ධම්මසිරි හිමි**



# පොළොන්නරු සාහිත්‍ය යුගය

අනුරාධපුර රාජධානියේ අවසන් කාල වකවානුව ලෙස සැලකෙන 10-11 සියවස් තුළ දකුණු ඉන්දීය ආක්‍රමණයන්ගේ බලපෑම් දැඩි විය. එයින් දෙමළ සාහිත්‍යයට අයත් අංග සිංහල සාහිත්‍යයට එක් විය. එමෙන් ම අභයගිරි සහ ජේතවන ආගමික මූලස්ථානයන් ඇසුරෙන් ව්‍යාප්ත වූ මහායාන දර්ශනය නිසා සංස්කෘත සාහිත්‍යයේ ආභාසය සිංහල සාහිත්‍යයට නොමඳ ව ලැබිණි. මේ ප්‍රධාන සිද්ධීන් දෙක හේතුවෙන් සිංහල සාහිත්‍යය විවිධ අංශ ඔස්සේ වැඩි දියුණු විය. විශේෂයෙන් සම්භාව්‍ය සිංහල සාහිත්‍යය භාෂාත්මක, කාව්‍යාත්මක, නිර්මාණාත්මක ස්වරූපයෙන් ප්‍රවර්ධනය වන්නේ මෙම යුගය තුළයි. අනුරපුර යුගයෙන් ඇරඹි ධර්ම සාහිත්‍යය පණ්ඩිතප්‍රිය මෙන් ම ජනප්‍රිය යන අංශද්වයෙන් ම සමාජගත වීමට තත්කාලීන දේශපාලනික, ආර්ථික, සංස්කෘතික පසුබිම ද බෙහෙවින් බලපෑ බව පෙනෙයි.

පොළොන්නරු රාජධානියේ ආරම්භය සිදු වන්නේ ක්‍රි.ව. 1058 දී එවකට අනුරාධපුරය යටත් කරගෙන සිටි සොළීන් පළවා හැර කීර්ති කුමාරයා පළමුවන විජයබාහු නමින් කිරුළු පැළඳීමත් සමගය. එවක් පටන් කාලිංඝ මාඝයන් (ක්‍රි.ව. 1234) දක්වා වසර 176 ක කාලයක් පොළොන්නරුව රාජධානිය අනුක්‍රමයෙන් දියුණු වෙමින් සහ පරසතුරු උපද්‍රවවලට මුහුණ දෙමින් රටේ අගනුවර ලෙස පැවතිණ. පොළොන්නරු රාජධානියේ සුවිශේෂී ම පාලකයන් ලෙස පොළොන්නරුව රාජධානිය පිහිටවූ පළමුවන විජයබාහු රජු සහ සියලු සතුරු වියවුල් නැතිකර ලක්දිව එක්සේසත් කර පොළොන්නරුව සමෘද්ධිමත් රාජධානියක් ලෙස සංවර්ධනය කළ පළමුවන පරාක්‍රමබාහු යන රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය, විශිෂ්ටත්වය සදනුස්මරණීය වේ.

මෙම යුගයේ සාහිත්‍යමය පසුබිම සාකච්ඡා කිරීමේ දී තත්කාලීන ශාසනික තත්ත්වය ද විමසිල්ලට ලක් කිරීම වැදගත් වේ. අනුරපුර යුගයේ අවසාන කාලය තුළ මහාවිහාරය, අභයගිරිය සහ ජේතවන යන කේන්ද්‍රස්ථානයන් අභ්‍යන්තර මෙන් ම බාහිර අර්බුදයන් නිසා පිරිහීමට ලක් ව තිබූ බව රාජාවලිය, නිකාය සංග්‍රහය වැනි ග්‍රන්ථවලින් ද වෙනත් ඓතිහාසික සාධකවලින් ද පැහැදිලි වෙයි. පොළොන්නරු රාජධානිය පිහිටුවීමෙන් පසු පළමුවන විජයබාහු රජතුමන්ගේ ප්‍රමුඛතම කාර්යය වූයේ ශාසන පුනරුදය ඇති කරලීමයි. ඊට අවශ්‍ය භික්ෂූන් නොසිටි නිසා රජතුමා අරමණ දේශයෙන් භික්ෂූන් වැඩමවා උපසම්පදාව ඇති කරලීම, සොළීන් අතින් විනාශ ව තිබූ විහාරාරාම ප්‍රතිසංස්කරණය කරවීම, භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය ප්‍රත්‍ය පහසුකම් සැලසීම සඳහා සෙල්ලිපි ආදිය පිහිටුවා අවශ්‍ය රාජානුග්‍රහය ලබා දීම ආදී සුවිශාල ශාසනික අනුග්‍රහයක් සිදු කරන ලදී. ඓතිහාසික තොරතුරුවලට අනුව පළමුවන විජයබාහු රජතුමන් පොළොන්නරු රාජධානිය ස්ථාපිත කළේ වී නමුත් සොළීන් ඇතුළු සතුරන්ගෙන් නිරතුරු ව බාධා එල්ල විය. එහෙත් ඒ සියල්ලට අභීත ව නොසැළී මුහුණ දුන් විජයබාහු රජතුමන්ගේ ශ්‍රේෂ්ඨත්වය, පළමුවන පරාක්‍රමබාහු රජුගේ කීර්තිය නිසා ලඝු කොට නොසැළකිය යුතුය. එසේ වන්නේ පළමුවන පරාක්‍රමබාහු රජුට වඩා දැවැන්ත අභියෝග රැසක් පළමුවන විජයබාහු රජුට එල්ල වූ බැවිනි.

කෙසේ වෙතත් පළමුවන විජයබාහු රජු ඇතිකළ ශාසනික ස්ථාවරත්වය ඔහුගෙන් පසු රජ පැමිණි පළමුවන ජයබාහු, පළමුවන වික්‍රමබාහු, දෙවන ගජබාහු යන රජවරුන්ට පවත්වා ගෙන යා නොහැකි වීම නිසා යළිත් සසුන පිරිහිණි. ක්‍රි.ව. 1153 දී පළමුවන පරාක්‍රමබාහු රාජ්‍ය සමය පොළොන්නරු රාජධානිය දේශපාලනික, ආර්ථික, ආගමික, සාමාජික ආදී සියලු අංශයන්ගෙන් සමෘද්ධිමත් විය. එතුමන් විසින් ශාසනික පුනරුදය සඳහා එවකට දිඹුලාගල ආරණ්‍යයේ වැඩ සිටි මහාකාශ්‍යප තෙරණුවන්ගේ සහාය ද ලබාගෙන භික්ෂූන් වහන්සේලා සඳහා පොළොන්නරු කතිකාවත නමින් විනය නීති සංග්‍රහයක් සකස් කරවන ලදී. එපමණක් නොව දුශ්ශීල භික්ෂූන් සසුනෙන් ඉවත් කරවා ඔවුන්ට ජීවන ක්‍රම ද සලසා දුන් බව සඳහන් වේ.

පළමුවන පරාක්‍රමබාහු රජුගේ අනුග්‍රහයෙන් ගොඩ නැගුණු මේ ශාසනික ප්‍රබෝධය එතුමන්ගේ අභාවයත් සමග යළිත් අර්බුදවලට ලක් වූ බවත් දඹදෙණි විජයබා කාලය දක්වා එය පැවතුණු බවත් ඉතිහාසය කියයි.



## සිංහල ධර්ම සාහිත්‍යයේ ආරම්භය

පොළොන්නරු ධර්ම සාහිත්‍යය බොහෝ දුරට සංස්කෘත,පාලි යන මාතෘ භාෂාවන්ගෙන් මෙන් ම හින්දු භක්තිවාදයේ ද ආභාසය ලබා වර්ධනය විය. විශේෂයෙන් දකුණු ඉන්දීය ආක්‍රමණයන් ද, අභයගිරි, ජේතවන දෙනිකායන් ඇසුරින් ව්‍යාප්ත වූ මහායාන දර්ශනයේ ඉගැන්වීම් නිසා ද භක්තිවාදය ප්‍රමුඛස්ථානයකට පත්විය. හින්දු ආගමිකයන්ගේ අසීමිත දේවභක්තියට පිළිතුරු දීම සඳහා බෞද්ධ පඬිවරුන් ද භක්ති රසය මුල් කරගත් ග්‍රන්ථ රචනා කරන්නට පෙළඹිණි. එසේ නොවන්නට බොහෝ දුරට මෙවැනි විශිෂ්ට සාහිත්‍ය කෘති රැසක් සිංහල සාහිත්‍යයට එකතු නොවන්නට ඉඩ තිබිණි. මෙම යුගයේ රචනා කළ ග්‍රන්ථයන් අතර වඩාත් වැදගත් කෘතීන් කිහිපයක් පහත දැක්වේ.

මේවායේ සාහිත්‍යමය වටිනාකම පිළිබඳ ව ඉදිරි කාලයේ දී සාකච්ඡා කිරීමට අදහස් කරමු.

- වෙසතුරු දා ගාථා සන්‍යය
- මුවදෙව් දා වත
- සසදාවත
- මහාබෝධිවංස ග්‍රන්ථිපදය
- ජාතක අටුවා ගැටපදය
- ජාතක ගාථා සන්‍යය
- පොළොන්නරු කතිකාවත
- අභිධර්මාර්ථ සංග්‍රහ සන්‍යය
- ධර්මප්‍රදීපිකා
- අමාවතුරු

**මතු සම්බන්ධයි .....**




## දසුණි

නුවර වීදියක ආධාර අයදිමින් ඔබ මොබ යද්දී ඒ මව මට හමුවුණි. ඇය, වන සිවුපාවුන් වැනි මිනිසුන් මැද වෙසෙන දෙවිදේවතාවුන් වැනි මිනිසුන් යැද කරමින් සිටියේ හද සසල කරවන ඉල්ලීමකි.
බිංගිරිය ප්‍රාදේශීය ලේකකම් කොට්ඨාශයේ බිංගිරිය ග්‍රාම නිලධාරි වසමේ පෙරකදෝරුවත්තේ පදිංචි දියණියන් දෙදෙනෙකුගේ මවක වන යූ ඩී එන් වසන්තිගේ කුළුදුල් දියණිය කොඳු ඇට පෙළ ඇදවීමේ රෝගී තත්ත්වයකට ගොදුරුව සිටින්නීය. බිංගිරිය ශ්‍රී සරණංකර ජාතික පාසලේ 2 වන ශ්‍රේණියේ ඉගනුම ලබන දසුණි තත්සරණි නම් වන ඒ දියණිය පරීක්ෂා කළ විශේෂඥ ශල්‍ය වෛද්‍ය ව්ඛ ණ යාටෑ නිර්දේශ කර ඇත්තේ ඉන්දියාවේ ඇපලෝ රෝහලේ සිදුකෙරෙන ශල්‍ය කර්මයක් මගින් මේ රෝගය සුව කළ හැකි බවය.



පේරාදෙණිය ශික්ෂණ රෝහලේ විකලාංග ශල්‍ය වෛද්‍ය විශේෂඥ ය න මර්ඇැර් විසින් ජනාධිපති අරමුදලට නිකුත් කර ඇති ලිපියක දැක්වෙන පරිදි ඒ සඳහා රෝහල් ගාස්තු වශයෙන් රුපියල් ලක්ෂ හතහමාරක් ගෙවිය යුතුවේ. පසු සැත්කම් ඖෂධ සහ සෙසු අවශ්‍යතා සඳහා තවත් රුපියල් ලක්ෂ දෙක හමාරක් පමණ වැය වෙතැයි ගණන් බලා තිබේ.



මේ වන විට විවිධ ආයතන සහ පරිත්‍යාගශීලීන්ගෙන් ලැබී ඇති මුදල සැත්කම සිදුකරගැනීමට ප්‍රමාණවත් මුදලක් (රුපියල් ලක්ෂ 8ක් පමණ) වන නමුත් එමගින් ගුවන් ප්‍රවේශ පත් ඇතුළු සෙසු වියදම් ආවරණය නොවන බව දසුණිගේ මව පවසයි. එබැවින් තවදුරටත් ශල්‍යකර්මය සිදුකිරීමට නොහැකි තත්ත්වයක් පවතින බවත් දියණියගේ රෝගී තත්ත්වය දිනෙන් දින උත්සන්න වෙමින් පවතින බවත් ඇය කියන්නීය. කරුණාබර ඔබට කළ හැකි ආධාරයක් වෙතොත් දසුණි වෙනුවෙන් ඇයගේ මව වෙත ලබා දෙන ලෙස කාරුණික ආයාචනයක් කෙරේ.

ඒ සඳහා පහත සඳහන් තොරතුරු ඔබට වැදගත් වනු ඇත.

මව-යූ ඩී එන් වසන්තිගේ දුරකථන අංකය- 071 5987369
ඇයගේ නමින් බිංගිරිය ලංකා බැංකුවේ පවත්වාගෙන යන ගිණුම් අංකය 75567234.